වෙළුම 43
2019 අප්‍රේල් - ජූනි
දෙවන කලාපය
ISSN 1991-040 X

# ගොවිකටයුතු පුවත්හසුන

කෘෂිකර්ම අමාත්‍යාංශය

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය



## සම්පත් සුරකිමින් වගා කරමු

# Research news in brief



# සම්පත් සුරකිමින් වගා කිරීම

ගංවතුර හා නියං වැනි අවස්ථාවන්හි වී වගාවට සිදුවන අහිතකර බලපෑම් අවම කිරීම පිණිස 'තිරසාර හා දේශගුණික විපර්යාස ප්‍රතිරෝධන ක්‍රමෝපායන් වගා පද්ධතීන්ට අන්තර්ගත කිරීම පිළිබඳ උපාය මාර්ග හඳුන්වා දීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි

## තිරසාර හා දේශගුණික විපර්යාස ප්‍රතිරෝධන ක්‍රමෝපායන් වගා පද්ධතීන්ට අන්තර්ගත කිරීම පිළිබඳ උපාය මාර්ග හඳුන්වාදීමේ ව්‍යාපෘතිය

දිගු කාලීන වියළි කාලගුණික තත්ත්වයන්, නියඟය සහ ගංවතුර වැනි අයහපත් දේශගුණික විපර්යාසයන්ගේ බලපෑම නිසා බෝග වගාවට සිදුවන අහිතකර බලපෑම් අවම කිරීම පිණිස තිරසාර හා දේශගුණික විපර්යාස ප්‍රතිරෝධන ක්‍රමෝපායයන් වගා පද්ධතීන්ට අන්තර්ගත කිරීම පිළිබඳ උපාය මාර්ග හඳුන්වා දීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි.

එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ මූල්‍ය ප්‍රතිපාදන මත හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය මූලික සේවා සම්පාදකයා වශයෙන් කටයුතු කරමින් කෘෂිකාර්මික හා ගොවිජන ක්ෂේත්‍රය හා සම්බන්ධ පාර්ශ්වකරුවන් රැසක් සමඟ සහයෝගයෙන් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි.

ආර්ථික නිර්දේශයන් මත බෝග කළමනාකරණය හා යාන්ත්‍රීකරණය ආශ්‍රිත ක්‍රමෝපායයන් පර්යේෂණ හා ආදර්ශන ආදී මැදිහත්වීම් හරහා ක්ෂේත්‍රය වෙත හඳුන්වා දීම මඟින් කුඩා ගොවිපොළ පද්ධතීන් වඩා තිරසාර හා ඉහළ මට්ටමේ දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීමේ හැකියාවෙන් යුතු තත්ත්වයට පත් කිරීමට සහය වීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන පරමාර්ථයකි.

වාරි ජල ඵලදායිතාව සහ සම්පත් භාවිතයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම තුළින් වී වගාවට සිදුවන දේශගුණික විපර්යාසයන්ගේ බලපෑම අවම කිරීමට පර්යේෂණ කණ්ඩායම ක්ෂේත්‍ර පර්යේෂණ තුළින් අත්හදා බැලීම් සිදු කරමින් සිටියි. තවද සංරක්ෂණ කෘෂිකාර්මික මූලධර්ම අනුගමනය කරමින් උස්බිම් ආශ්‍රිත අතිරේක බෝග හා එළවළු වගා පද්ධතීන්ගේ තිරසර භාවය ඉහළ නැංවීමට අදාළ ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් ද මෙම ව්‍යාපෘතිය හරහා ක්‍රියාත්මක කරනු ලබයි. මෙම ක්ෂේත්‍ර පරීක්ෂණ හා ආදර්ශන අනුරාධපුර දිස්ත්‍රික්කයේ තිරප්පනේ එල්ලංගා පද්ධතියට අයත් මීගස්සෑගම වැව ආශ්‍රිතව සිදු කරනු ලබයි.

එමෙන් ම සුළු පරිමාණ ගොවීන්ගේ සමාජ ආර්ථික තත්ත්වය හා දේශගුණික විපර්යාස හමුවේ ඔවුන්ගේ වගා රටාවන් හි සිදු වී ඇති වෙනස්කම් අධ්‍යයනය කිරීම සඳහා මහා වාරි, මහවැලි, සුළු වාරි සහ වර්ෂාපෝෂිත යන සියලුම අංශ නිරීක්ෂණය වන පරිදි අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් තෝරා ගත් ගොවි පවුල් 1100ක ගෙන් පසුගිය කන්න තුනකට අදාළ කෘෂිකාර්මික දත්ත මෙන් ම අනෙකුත් සමාජ ආර්ථික දත්ත රැස් කිරීම සිදු කරනු ලබයි.

පාරිසරික හා ජල සම්පත් කළමනාකරණ අංශයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරීන් වන ශාන්ත හේවගේ, සිදත් බණ්ඩාර, ගීතානී සමරසිංහ සහ තිලණි පද්මජානි යන මහත්ම මහත්මීන් සහ පර්යේෂණ නිලධාරිනියන් වන මාලතී රම්බොඩගෙදර, උත්පලා ජයසිංහ සහ නදීශා ඩයස් යන මහත්මීන් පර්යේෂණ කණ්ඩායමට අයත් වෙති.



# ඌව පළාත තුළ වෙසෙන ග්‍රාමීය දිළිඳු ජනයා වෙත ක්ෂුද්‍රමූල්‍ය ණය සැපයුම සහ එහි භාවිතය

වර්තමානයේ ක්ෂුද්‍ර මූල්‍ය සේවාව ශ්‍රී ලංකාවේ විශේෂයෙන්ම ග්‍රාමීය ක්ෂේත්‍රයේ ප්‍රචලිත ණය යාන්ත්‍රණය බවට පත්ව තිබේ. මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ ඌව පළාත  තුළ වෙසෙන ග්‍රාමීය දිළිඳු ජනයා අතර ක්ෂුද්‍රමූල්‍ය සැපයුමෙහි වපසරිය සහ එහි ඵලදායිතාවය පිළිබඳ අධ්‍යනය කිරීමයි. විශේෂයෙන්ම එහිදී ණය උපයෝජනය සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කර තිබේ.

ඌව පළාතේ ගම් 22කින් තෝරා ගත් අතිශය දිළිඳු පවුල් 392ක සහභාගීත්වයෙන් අධ්‍යයනය සිදු කර තිබේ. නියැදියේ බහුතරයකගේ ජීවිකාව කෘෂිකර්මාන්තය වීමෙන් මෙම නියැදිය ග්‍රාමීය දුප්පත් ගොවිජනතාවගෙන් සමන්විත වන අතර විශේෂයෙන්ම ඔවුන්ගෙන් අතිශය බහුතරයක් කාන්තාවෝ වෙති. දේශගුණික විචලතා හේතුවෙන් බෝග හා පශු සම්පත් කටයුතුවලදී විශාල අරගලයක නිරතව සිටින අතරතුර ඔවුන් ක්ෂුද්‍ර මූල්‍ය සේවාවන්වල ප්‍රතිලාභ භුක්ති විඳිනු ලබන නමුත් එම සේවාවන්වල ගොදුරු බවටද පත්ව සිටින ආකාරය මෙම අධ්‍යයනයෙන් විමර්ශනාත්මකව පෙන්වා දී තිබේ. ණයගැතියෝ බහුතරයක් කන්න බෝග සඳහා වගා ණය ලබා ගෙන තිබුණ ද ගිවිසුමෙහි පරිදි ණය ආපසු ගෙවීමට හේතු දෙකක් මත අපොහොසත්ව සිටිති. සැලසුම් නොකළ වියදම් සඳහා ණය භාවිතා කිරීම හා බෝග විනාශ වීම එම හේතුයි.ණය එකතුකරන්නන්ගෙන් ගැලවීමට නොහැකි වීමෙන් හා දරාගත නොහැකි ණය පොළී අනුපාත හේතුවෙන් ණයගැතියෝ උග්‍ර අර්බුදයකට මුහුණ දී සිටිති.

මෙකී තත්ත්වය හේතුවෙන් කෘෂිකර්ම අමාත්‍යාංශය කෙතරම් නවමු හා කාර්යක්ෂම මුහුණුවරකින් ග්‍රාමීය දිළිඳු ගොවි ජනතාවගේ ණය පීඩනය අවම කිරීමට මැදිහත් විය යුතුදැයි අධ්‍යයනයෙන් අවධාරණය කර තිබේ. එහි දී ගොවිජන බැංකු වැනි ස්වකීය යාන්ත්‍රණයන් හරහා වගා ණය ලබා ගැනීමේ හැකියාව සහ ප්‍රවේශය වැඩි දියුණු කිරීම අමාත්‍යාංශයට සිදුකළ සිදුහැකිය.

කෘෂිකර්ම අමාත්‍යාංශය ස්වකීය කාන්තා පාදක ගොවි සංවිධාන හරහා කෘෂි පාදක ව්‍යවසායකත්ව සංවර්ධනය කිරීමෙන් ද මෙම ගැටලුව විසඳීමට මැදිහත් විය හැකි හොඳ විකල්පයකි.

කෘෂි සම්පත් කළමනාකරණ අංශයේ පර්යේෂණ නිලධාරිනි තුෂාරා ධර්මවර්ධන මෙනෙවිය විසින් මෙම අධ්‍යයනය මෙහෙයැවූ අතර සම පර්යේෂකයින් ලෙස එම අංශයේ අධි පර්යේක රේණුකා වීරක්කොඩි මහත්මිය, පර්යේෂණ නිලධාරීන් වන රිෆානා බුහාරි, දිනූෂා රත්නායක සහ අමල් දිසානායක යන මහත්ම මහත්මීහු කටයුතු කර ඇත.

පර්යේෂණ කණ්ඩායම විසින් වැඩිදුරටත් පෙන්වා දෙන්නේ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන අනිවාර්යයෙන් ලියාපදිංචි කිරීම, ණය සුදුසුකම් නිසි ලෙස තක්සේරු කිරීම මත පදනම්ව ණය බෙදා හැරීම, ණය ආයෝජනය සඳහා ශක්තිමත් අධීක්ෂණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම, පහසු ණය ලක්ෂණ සහ මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් පැවැත්වීම වැනි ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රයට අදාළ කාරණා නියාමනය කිරීම පිණිස ස්ථාපිත යාන්ත්‍රණයක් සකස් කිරීම අවශ්‍ය වන බවයි.





# ශ්‍රී ලංකාවේ එළවළු ගොවීන් තීරණ ගැනීම සඳහා බලපාන සාධක සම්බන්ධ අධ්‍යයනය

එළවළු ගොවීන්ගේ නිෂ්පාදන තීරණ ගැනීම සඳහා දැනට පවතින තොරතුරු හුවමාරු වන මෙවලම් (Tools)/ යෙදුම් (Applications) /පද්ධතිවල (Systems) ඵලදායීතාවය පරීක්ෂා කිරීම හා සහ ගොවීන්ගේ නිෂ්පාදන තීරණ ගැනීමේ ක්‍රියාවලියට බලපාන නිර්ණායක හඳුනා ගැනීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණු වේ. ඒ මගින් ශ්‍රී ලංකාවේ එළවළු නිෂ්පාදන ක්ෂේත්‍රයේ සම්පත් භාවිතයේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම පිණිස උපාය මාර්ග සම්පාදනය කළ හැකි වේ.

කුරුණෑගල, නුවරඑළිය, මහනුවර, බදුල්ල, හම්බන්තොට, රත්නපුර, පුත්තලම සහ අනුරාධපුරය යන දිස්ත්‍රික්කවලින් අධ්‍යයනය සඳහා තෝරා ගත් නියැදියේ ප්‍රමාණය ගොවීන් 480කි. අධ්‍යයනය 2019 ජනවාරි මාසයේ ආරම්භ වූ අතර 2020 ඔක්තොම්බර් මාසයේ අවසන් කිරීමට නියමිතය.

අධ්‍යයනයේ සම්බන්ධීකරණ කටයුතු සිදු කරනු ලබන්නේ අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශයේ පර්යේෂණ නිලධාරී අයි.පී.පී.එම්. විජේසිංහ මහතා වන අතර සම පර්යේෂකවරුන් ලෙස අධි පර්යේෂක ආචාර්ය රංජිත් වික්‍රමසිංහ, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී ආචාර්ය ටී.ඒ.සී ප්‍රියංකර මහතා සහ පර්යේෂණ නිලධාරී විරාජිත් කුරුප්පු යන මහත්වරු කටයුතු කරති.




# කොරටුවෙන් වෙළෙඳපොළට

*නිෂ්පාදකයින්, අලෙවිකරුවන් සහ පාරිභෝගිකයින් යා කෙරෙන ජංගම දුරකථන මෘදුකාංගයක්*

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ භූගෝල විද්‍යා තොරතුරු පද්ධති ඒකකය නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් මධ්‍යස්ථානය සමඟ එක්ව ගොවීන්, අලෙවිකරුවන් සහ පාරිභෝගිකයින් එකට එකතු කරන ජංගම දුරකථන මෘදුකාංගයක් හඳුන්වා දීමට යයි. එමගින් කෘෂිකාර්මික නිෂ්පාදන වෙළඳපොළෙහි ක්‍රියාකාරීන් වන ගොවීන්, අලෙවිකරුවන් සහ පාරිභෝගිකයින් සම්බන්ධ කරන අතරම අලෙවිකරණ ගැටලු විසඳීමට හා පසු අස්වනු හානි අවම කිරීම හා විදෙස් වෙළඳපොළ අත්පත් කර ගැනීමට ද අපේක්ෂා කෙරේ.

භූගෝල විද්‍යා තොරතුරු පද්ධති ඒකකයේ අධි පර්යේෂක එච්.එම්.ජේ.කේ හේරත් මහතා මෙම මෘදුකාංගය නිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය භාරව කටයුතු කරයි.

# අලෙවි තොරතුරු ව්‍යාපෘතිය ඇගයීමට ලක්වේ


Ministry of Agriculture

AWARDS FOR BEST CONTRIBUTOR IN THE AGRICULTURE SECTOR - 2018

Awarded by

His Excellency The President of Democratic Socialist Republic of Sri Lanka

Hon. Maithripala Sirisena

Awarded the Certificate of Appreciation in the

"Research Category"

On 11th December 2018

to

Mr. W H D Priyadarshana
Ms. R P Vidanapathirana
Ms. R N K Rambukwella
Mr. W A N Wijesooriya
Ms. P A J Champika
Ms. I K Edirisinghe

In consideration of the research on

"Market Intelligence Project"

Mr. K. D. S. Ruwanchandra
Secretary
Ministry of Agriculture

Dr. S. S. B. D. G. Jayawardena
Chairman
Sri Lanka Council for Agricultural Research Policy

කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද '2018 වර්ෂයේ කෘෂිකර්මාන්තය වෙනුවෙන් දක්වන ලද විශිෂ්ට දායකත්වය ඇගයීම පිළිබඳ සම්මාන උළෙලේදී හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ 'අලෙවි තොරතුරු ව්‍යාපෘතිය'' ඇගයීමට ලක්ව ඇත. මෙම සම්මාන උළෙල කෘෂිකර්ම අමාත්‍යාංශය සහ කෘෂි නවීකරණ ව්‍යාපෘතිය මඟින් සංවිධානය කර තිබුණි.

2015-2018 කාලය තුළ අලෙවි තොරතුරු ව්‍යාපෘතිය හරහා රටේ ප්‍රතිපත්ති සම්පාදනයට ජීවන වියදම් කමිටුව ඔස්සේ දක්වන ලද සුවිශේෂී දායකත්වය සහ විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ඔස්සේ සියලු පාර්ශ්වයන්ට තොරතුරු ලබා දීම පිළිබඳව සිදු කරන ලද විශ්ලේෂණාත්මක විවරණයක් තුළ 'පර්යේෂණ කාණ්ඩය' යටතේ සහතික පත්‍රයක් දිනාගෙන තිබේ.

මෙම කාල සීමාව තුළ අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශයේ අංශ ප්‍රධාන ව සිටි සහ අලෙවි තොරතුරු ව්‍යාපෘතියේ සම්බන්ධීකාරක ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී ඩබ්.එච්. දුමින්ද ප්‍රියදර්ශන මහතාගේ සෘජු අධීක්ෂණය යටතේ අලෙවි තොරතුරු ව්‍යාපෘතිය ක්‍රියාත්මක විය. මෙම ජයග්‍රහණයට දායක වූ අලෙවි තොරතුරු ව්‍යාපෘතියේ පර්යේෂණ කණ්ඩායම වන්නේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරීන් වන දුමින්ද ප්‍රියදර්ශන, රුවිනි විදානපතිරණ, රෝෂිණී රඹුක්වැල්ල, නාලක විජේසූරිය සහ පර්යේෂණ නිලධාරිනියන් වන ඉන්දිකා එදිරිසිංහ, ජයමිණි චම්පිකා යන මහත්ම මහත්මීන් ය.

# ශ්‍රී ලංකාවේ කුඩා පරිමාණ ගොවීන්ගේ යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP)

## තත්ත්වය, අභියෝග, අපේක්ෂා සහ ප්‍රතිපත්ති උපාය මාර්ග



වර්තමානයේ දී ප්‍රමිතීන් සහ තාක්ෂණික නියාමනයන් වෙළෙඳපොළ තුළ වැදගත් ස්ථානයක් අත් කරගෙන ඇති අතර නූතන පාරිභෝගිකයා ආරක්ෂිත ආහාර ලබා ගැනීම මෙන් ම පරිසරය සහ සේවක සුභසාධනය පිළිබඳ වැඩි සැලකිල්ලක් දක්වයි.

'යහපත් කෘෂිකාර්මික පිළිවෙත්' Good Agriculture Practices 'GAP' උක්ත අභිලාශයන් ඉටු කර ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති සංකල්පයක් මෙන් ම ප්‍රායෝගිකව ශ්‍රී ලංකාව තුළ දැන් ක්‍රියාත්මක වන කර්තව්‍යයකි.

මෙම ව්‍යාපෘතිය කෘෂිකර්ම දෙපාර්තුමේන්තුවේ ව්‍යාපෘති හා පුහුණු මධ්‍යස්ථානයේ කෘෂි ව්‍යාපෘති උපදේශක අංශය මඟින් සිදු කරනු ලබයි. මෙමඟින් දේශීය වෙළෙඳපොළ මෙන් ම විදේශීය වෙළෙඳපොළ සඳහා එළවළු සහ පලතුරු නිෂ්පාදනයේ දී අගය දාමයන් තුළ උපදෙස් දීම, පරීක්ෂා කිරීම මඟින් නිෂ්පාදනවල ගුණත්වය තහවුරු කිරීම සඳහා ක්‍රියා කරනු ලබයි.

මෙම ක්‍රියාවලිය තවදුරටත් සාර්ථකව ක්‍රියාත්මක කිරීමේ දී ඇති බාධාවන් හඳුනා ගත යුතු අතර ධනාත්මක සාධක පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම වැදගත් වේ.

මෙම අධ්‍යයනයේ සුවිශේෂ අරමුණු වන්නේ තෝරාගත් දිස්ත්‍රික්කවල යහපත් කෘෂිකාර්මික පිළිවෙත් භාවිතය පිළිබඳ ක්‍රමවේද අධ්‍යයනය කිරීම සහ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී ඇති ධනාත්මක මෙන් ම සෘණාත්මක සාධක හඳුනා ගැනීම මඟින් ප්‍රතිපත්ති සම්පාදකයන්ට ඒ සඳහා ක්‍රියාත්මක වීමට අදාළ තොරතුරු ලබා දීමයි.

අධ්‍යයනයේ සොයා ගැනීම් වලට අනුව උක්ත වැඩසටහන කාලීනව ඉතාමත් වැදගත් වැඩසටහනක් ලෙස අවධාරණය කළ හැකි අතර 'GAP' සහතිකය සඳහා වැඩි වටිනාකමක් ලබා දීමට කටයුතු කිරිම කාලීන අවශ්‍යයතාවය කි. මේ අතර වර්තමානයේ 'GAP' වැඩසටහන පිළිබඳව ජනතාව තුළ ඇති නො දැනුවත්භාවය එම නිෂ්පාදන සඳහා ඉහළ මිලක් ලබා ගැනීමට බාධාවක් වී ඇත. එබැවින්, 'GAP' වැඩසටහන සඳහා පාරිභෝගිකයින් අතර ප්‍රචලිත කිරීමට කටයුතු කිරීම ප්‍රවර්ධන වැඩසටහනෙන් සිදු කළ යුතු ය. මේ අතර දීප ව්‍යාප්තව 'GAP' නිෂ්පාදන අලෙවි සැල් ඇති කිරීම සහ ගබඩා කිරීම සඳහා අවම වශයෙන් ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශවලත් ශීතාගාර පහසුකම් ඇති කළ යුතු ය.

දැනට ක්‍රියාත්මක කරන 'GAP' පිළිබඳව සහ අදාළ වෙනත් කරුණු සම්බන්ධව දැනුවත් කිරීමේ පුහුණු සැසි ප්‍රයෝජනවත් ලෙස ගොවීන් හඳුනාගෙන ඇතත් පුහුණු සැසි සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන බව අවධාරණය කරනු ලබයි. තවදුරටත් ක්ෂේත්‍ර දින සහ ගොවිපළ නිරීක්ෂණ චාර්තා සිදු කළ යුතු බව අධ්‍යයනයේ දී අනාවරණය වී ඇත.

තව ද රජයේ මැදිහත් වීමෙන් වැඩසටහන සඳහා ගොවීන් ආකර්ෂණය කර ගැනීමට සහන ලබා දීමට (අදාළ උපකරණ සඳහා 50%ක වට්ටම් ලබා දීම) කටයුතු කළ යුතු අතරම 'GAP' නිෂ්පාදන සඳහා නියමිත මිලක් ලබා දීමට කටයුතු කළ යුතු බව මෙම අධ්‍යයනයෙන් අවධාරණය කෙරේ.

කෘෂිකාර්මික ප්‍රතිපත්ති සහ ව්‍යපෘති ඇගයීම් අංශයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනි බී.ඒ.ඩී.එස් බමුණුආරච්චි මහත්මිය මෙම අධ්‍යයනයේ සම්බන්ධීකාරක වශයෙන් කටයුතු කරන අතර සම පර්යේෂකවරුන් ලෙස ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනියන් වන සාගරිකා හිටිහාමු මහත්මිය සහ සුසිලා ලූර්දු මහත්මිය කටයුතු කරති.





# කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා වූ පුහුණු වැඩසටහන

ගොවි කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා වූ එක් දින පුහුණු වැඩසටහන් මාලාවක් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා මධ්‍යස්ථාන 20 ක් පුරා පැවැත්වීමට 2019 වර්ෂයේ මුල් කාර්තුව තුළ හැකි විණි.

මෙම වැඩසටහනින් “සිදුමු” ගොවි සංවිධාන නායකයින් 2175 දෙනෙකු පුහුණු කිරීමට හැකියාව ලැබී තිබේ.

මෙම පුහුණු වැඩසටහනේ අරමුණු වන්නේ පෝෂණීය ගෙවත්ත යන සංකල්පය සඳහා තිරසාර ක්‍රමවේදයක් ගොඩ නැංවීම, පෝෂණීය ගෙවත්ත තුළින් පෝෂණීය හා සෞඛ්‍යසම්පන්න ආහාර වේලක් මඟින් නිරෝගී පරපුරක් බිහි කිරීම, ගෙවත්ත අතිරේක ආදායම් මාර්ගයක් බවට පත් කිරීම සඳහා කාලය, ශ්‍රමය හා මුදල් ප්‍රශස්ත ලෙස උපයෝජනය කර ගැනීම සඳහා කුසලතාවයෙන් යුත් කළමනාකාරණ සංවිධානාත්මක හැකියාවන්ගෙන් යුක්ත ආත්මවිශ්වාසය ගොඩ නැංවුණු, ආත්ම අභිමානයෙන් යුක්ත වූ කාන්තාවන් බවට බල ගැන්වීම සහ සමෘද්ධිමත් ගොවි සමාජයක් බිහි කිරීමයි.

මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශයේ අංශ ප්‍රධාන අධි පර්යේෂක එස්.එම්.ඒ සමරකෝන් මහතා වැඩසටහන සම්බන්ධීකරණය කරන අතර පර්යේෂණ නිලධාරී සංගීත් ප්‍රසාද් ප්‍රනාන්දු සම පර්යේෂක වශයෙන් කටයුතු කරයි. අධි පර්යේෂක එච්.එම්.ජේ.කේ හේරත් මහතා බාහිර සම්පත් දායකයෙකු වශයෙන් කටයුතු කරයි.

# සහභාගීත්ව ගැමි ප්‍රවේශය තුළින් ඵලදායී ග්‍රාමීය සංවර්ධනයක්

ප්‍රජාව කේන්ද්‍ර කර ගත් වැඩසටහන්වල දී ග්‍රාමීය ප්‍රජා දායකත්වයෙන් ප්‍රජා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම අත්‍යවශ්‍ය කරුණකි.

එබැවින් ප්‍රජා ක්‍රියාකාරී සලැසුම් සකස් කිරීම පිළිබඳ විධිමත් පුහුණුවක් ග්‍රාමීය සංවර්ධනය හා සෘජුව කටයුතු කරන නිලධාරීන් විසින් ලබා තිබීම එකී වැඩසටහන් සාර්ථකත්වයට ඉවහල් වන්නකි. ප්‍රජා සහභාගීත්වය තුළින් ග්‍රාමීය සංවර්ධනය සඳහා ප්‍රජා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම පිළිබඳ මූලික සංකල්ප හා ක්‍රමවේදයන් සම්බන්ධව ගැඹුරින් දැනුවත් කිරීම හා නිලධාරීන්ගේ දැනුම හා හැකියා වර්ධනය මෙහි අරමුණයි.

2019 පළමු කාර්තුව තුළ පුහුණු වැඩසටහන් දෙකක් පැවැත් වූ අතර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට හා දිස්ත්‍රික් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවලට අයත් ව්‍යාපෘති නිලධාරීන් 38 දෙනෙකු එක් වැඩසටහනකින් ද, කුරුණෑගල දිස්ත්‍රික් මහලේකම් කාර්යාලයට සම්බන්ධ සංවර්ධන නිලධාරීන් සහ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ මඩහපොල ගොවිජන සේවා මධ්‍යස්ථානයට සම්බන්ධ නිලධාරීන් 30 දෙනෙකු වශයෙන් පුහුණුවට සම්බන්ධ වූහ.

මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශයේ අංශ ප්‍රධාන අධි පර්යේෂක එස්.එම්.ඒ සමරකෝන් මහතා වැඩසටහන සම්බන්ධීකරණය කරන අතර පර්යේෂණ නිලධාරී සංගීත් ප්‍රසාද් ප්‍රනාන්දු සම පර්යේෂක වශයෙන් කටයුතු කරයි. බාහිර සම්පත්දායකයින් ලෙස හිටපු අතිරේක අධ්‍යක්ෂ ආර්.එල්.එන් ජයතිස්ස මහතා, අධි පර්යේෂක එච්.එම්.ජේ.කේ හේරත් මහතා, පර්යේෂණ නිලධාරී විරාජිත් කුරුප්පු මහතා සහ පර්යේෂණ නිලධාරී අමල් දිසානායක යන මහත්වරු කටයුතු කරති.



# 'පෝෂණීය ආහාර වේලක අවම පිරිවැය' ගණනය කිරීම සඳහා වූ පුහුණු වැඩසටහන

කිසියම් රටක ජනතාවට පෝෂණීය ආහාර වේලක් සඳහා වැය කළ හැකි පිරිවැය මිනුම් කිරීම සඳහා ගෝලීයව ඉතා බහුලව භාවිතා වන ක්‍රමවේද අතරින් 'පෝෂණීය ආහාර වේලක අවම පිරිවැය' (Minimum cost of nutritious Diet) ක්‍රමය තවත් එක් ක්‍රමයකි.

එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර වැඩසටහනෙ හි සහයෝගය ඇතිව හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය පෝෂණීය ආහාර වේලක අවම පිරිවැය ගණනය කිරීමේ පද්ධතියක් 2014 වසරේ දී අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය තුළ ස්ථාපිත කරනු ලැබී ය. එතැන් සිට සෑම වර්ෂයකම එම විශ්ලේෂණය යාවත්කාලීන කරමින් අනෙකුත් අදාළ පාර්ශවකරුවන් වෙත ප්‍රතිඵල ලබා දීම අඛණ්ඩව සිදු කරනු ලබයි.


මෙම වැඩසටහනේම දිගුවක් ලෙස දැනට ශ්‍රී ලංකාව තුළ පෝෂණීය ආහාර වේලක අවම පිරිවැය විශ්ලේෂණයෙ හි නිරත පර්යේෂකයින් සහ වෘත්තීයවේදීන්ගේ දැනුම සහ කුසලතා වර්ධනය කිරීම සඳහා සිව්දින පුහුණු වැඩසටහනක් ලෝක ආහාර වැඩසටහනෙ හි සහයෝගය ඇතිව සංවිධානය කෙරුණි. පෝෂණීය ආහාර වේලක අවම පිරිවැය ගණනය කිරීම සඳහා නවීන මෘදුකාංග, විශ්ලේෂණ ක්‍රම හා විධික්‍රම පිළිබඳ නව තාක්ෂණික දැනුම ලබා දීම පුහුණු වැඩසටහනෙහි අරමුණ විය.

පුහුණු වැඩසටහන 2019 පෙබරවාරි මස 25 දින සිට 28 දින දක්වා ආයතනයේ සුබසිංහ ශාලාවේදී පැවැත්වුණි.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ කීර්ති බී. කොටගම මහතා, ලෝක ආහාර වැඩසටහනේ ශ්‍රී ලංකා නියෝජ්‍ය නියෝජිත ග්‍යූයෙන්ඩක් හොඇන්ග් මහතා සහ ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (සැලසුම්) එච්.පී සෝමතිලක මහතා පුහුණු වැඩමුළුවේ සමාරම්භක අවස්ථාවට එක් වූ අතර කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් කේ.ඩී.එච් රුවන්චන්ද්‍ර මහතා, ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම් කේ මහේසන් මහතා සහ ලෝක ආහාර වැඩසටහනේ ශ්‍රී ලංකා නියෝජිත බ්‍රෙන්ඩා බාර්ටන් මහත්මිය ඇතුළු පිරිසක් වැඩසටහනේ සමාප්ති අවස්ථාවට එක්වූහ. වැඩමුළුවට සහභාගීවූවන් හට සහතික පත්‍ර බෙදාදීම ද ඒ මහත්වරුන් අතින් සිදු විය.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පෝෂ්‍ය පර්යේෂණ නිලධාරී ආචාර්ය එන්.පී.ජී සමන්ත මහතා පුහුණු වැඩමුළුව සම්බන්ධීකරණය කළේය.

## ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පළමු ප්‍රකාශනය


AGRARIAN RESEARCH & TRAINING INSTITUTE

RESEARCH STUDY SERIES

COST OF PRODUCTION OF PADDY
YALA 1972

A STUDY BASED ON RECORD KEEPING FARMERS IN FIVE SELECTED DISTRICTS

by
K. IZUMI
A.S. RANATUNGE

STUDY NO: 1
JULY 1973

33 ELIBANK ROAD
COLOMBO 5
SRI LANKA

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ ප්‍රථම ප්‍රකාශනය ලෙස වාර්තාගතව ඇත්තේ 1973 වර්ෂයේ ජුලි මස මුද්‍රණය වූ "Cost of Production of Paddy; Yala 1972" නම් ග්‍රන්ථයයි. හම්බන්තොට, පොළොන්නරුව, කුරුණෑගල, මහනුවර සහ කොළඹ යන තෝරාගත් දිස්ත්‍රික්ක පහක තොරතුරු ඇසුරින් සිදුකළ අධ්‍යයනයක් ඇසුරින් එය සම්පාදනය කර තිබේ. සිංහල සහ ඉංග්‍රීසි යන භාෂා ද්විත්වයෙන් මෙය ප්‍රකාශයට පත් ව තිබේ.





## ජාතික විගණන පනත පිළිබඳ දැනුවත් කිරීමක්

'විගණන විධිවිධාන සහ විගණන ගැටලු නිරාකරණය කිරීම' පිළිබඳ දේශනයක් හිටපු විගණකාධිපති සරත් චන්ද්‍රසිරි මායාදුන්නේ මහතා විසින් 2019 මැයි මස 31 වන දින සුබසිංහ ශාලාවේ දී පැවැත්විණි.

සියලුම මාණ්ඩලික නිලධාරීන් සඳහා පැවති මෙම දේශනය තුළින් මෑතක දී සම්මත වූ විගණන පනතේ නව විධිවිධාන සහ රාජ්‍ය නිලධාරීන් සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳ හරවත් දේශනයක් තුළින් කරුණු පැහැදිලි කරන ලදී.

## වෙසක් උත්සව දින සැමරුම

මැයි මස 17 දිනට යෙදී තිබූ ජාතික වෙසක් උත්සවය නිමිත්තෙන් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ සුබ සාධක සංගමය විසින් සුමධුර ධර්ම දේශනයක් සහ වෙසක් කූඩු තරඟයක් සංවිධානය කරන ලදී. ධර්ම දේශනය පවත්වනු ලැබුවේ පූජ්‍යපාද කැලණියේ අමිත ස්වාමීන් වහන්සේ විසිනි. ධර්ම දේශනාව අවසානයේ සව් කැඳ දන්සැලක් ද සංවිධානය කර තිබුණි.

වෙසක් කූඩු තරඟයේ ජය හිමි වූයේ පරිපාලන අංශය විසින් ඉදිරිපත් කළ වෙසක් කූඩුවට වූ අතර දෙවන සහ තෙවන ස්ථාන පිළිවෙළින් කෘෂි සම්පත් කළමනාකරණ අංශයට හා ගිණුම් අංශයට හිමි විය.


ගොවිකටයුතු පුවත් හසුන

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ ප්‍රකාශන ඒකකය මඟින් පළ කෙරෙන ත්‍රෛමාසික ප්‍රකාශනයකි. ගොවිකටයුතු ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ හා ක්‍රියාකාරී වැඩසටහන්වල දී ලබා ගන්නා පර්යේෂණ තොරතුරු මෙ මඟින් ප්‍රකාශයට පත් කෙරේ.
ලබා ගත් මූලය සඳහන් කරමින් මෙහි ඇති කරුණු උපුටා ගත හැකි ය.

උපදේශකත්වය
කීර්ති බී. කොටගම
අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී

අධීක්ෂණය
එස්.ඒ.සී.යූ සේනානායක
ජ්‍යෙෂ්ඨ ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරී

සම්පාදනය
වසන්ති රාජපක්ෂ
ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරිනි

නිර්මාණකරණය
උදේනි කරුණාරත්න

ගොවිකටයුතු පුවත් හසුන
ප්‍රකාශනය, මුද්‍රණය සහ
බෙදා හැරීම

හෙක්ටර් කොබ්බෑකඩුව
ගොවිකටයුතු පර්යේෂණ හා
පුහුණු කිරීමේ ආයතනය

දුරකථනය - 0112 696981,
ෆැක්ස් - 0112 692423
වෙබ් www.harti.gov.lk
ෆේස්බුක් https://www.facebook.com/hartilk/



හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු
පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
අංක 114 - විජේරාම මාවත,
කොළඹ 07